# විශේෂ නිවේදනයයි.

ඊශ්‍රායලයේ වාසය කරන ශ්‍රී ලංකාව බලා යාමට බලාපොරොත්තු වන
සියලුම ශ්‍රී ලාංකික ප්‍රජාව වෙත,

**විදේශගත ශ්‍රී ලාංකිකයන් කොරෝනා (COVID -19) වසංගත කාලය තුළ ශ්‍රී ලංකාවට පැමිණීමේදී අදාල වන ශ්‍රී ලංකා සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද නව නිරෝධායන නීතිරීති**

සියළුම ශ්‍රී ලාංකිකයන් ශ්‍රී ලංකාවට පැමිණීමට පෙර ශ්‍රී ලංකා විදේශ අමාත්‍යාංශයේ සහ අදාල අනෙකුත් ආයතන වල අවසරය ලබාගත යුතුය.

සියළුම ශ්‍රී ලාංකිකයන් ශ්‍රී ලංකාවට පැමිණි අවස්ථාවේදී සෞඛ්‍ය ප්‍රකාශය (Health Declaration Form) නිසි පරිදි සම්පූර්ණ කර ගුවන් තොටුපලෙහි පිහිටා ඇති සෞඛ්‍ය මධ්‍යස්ථානයට ලබාදිය යුතුය.

ඊට අමතරව,

**1. විදේශයකදී COVID -19 ට අදාල ප්‍රතිශක්තිකරණ එන්නතක් නිර්දේශිත නියමිත මාත්‍රා (Doses) ගණන ලබාගෙන සති 02 කට පසුව ශ්‍රී ලංකාවට පැමිණෙන්නන්,**

I. COVID -19 වලට අදාල ප්‍රතිශක්තිකරණ එන්නතෙහි නිර්දේශිත නියමිත මාත්‍රා (Doses) ගණන ලබා තිබිය යුතුය.

II. එන්නතෙහි නිර්දේශිත නියමිත මාත්‍රා (Doses) ගණන ලබා ගැනීමෙන් පසු සති 02 සම්පූර්ණ විය යුතුය.

III. ගුවන් තොටුපලට පැමිණි අවස්ථාවේදී COVID -19 එන්නත ලබා ගත් බව සඳහන් සහතික පත්‍රය ගුවන් තොටුපලේ සෞඛ්‍ය නිලධාරියාට ඉදිරිපත් කළ යුතුය. (එය ඉංග්‍රීසි භාෂාවෙන් නොමැති නම් සහතික කරන ලද පරිවර්තනයක් තිබිය යුතුය.)

IV. අනතුරුව ඔවුන් රජයේ ප්‍රවාහන පහසුකම් යටතේ හෝටලයකට/ නිරෝධායන මධ්‍යස්ථානයකට රැගෙන යනු ලැබේ.

V. ශ්‍රී ලංකාවට පැමිණ පැය 24 ඇතුලත (පළමු දිනය තුළ ) ඔවුන් PCR පරීක්ෂණයක් රජයේ පරීක්ෂණාගාරයකින්/ සෞඛ්‍ය අමාත්‍යාංශය අනුමත පෞද්ගලික පරීක්ෂණාගාරයකින් සිදු කළ යුතුය.

VI. PCR ප්‍රතිඵල ලද පසුව, PCR සාම්පල් ලබාගත් දිනය සහ ප්‍රතිඵලය ද ඇතුලත් මුද්‍රාහැරීමේ සහතිකයක් ද සහිතව නිරෝධායන බලධාරින් විසින් ඔවුන්ව හෝටලයෙන්/නිරෝධායන මධ්‍යස්ථානයෙන් තම නිවෙස් වෙත යාමට නිදහස් කරනු ලැබේ.

VII. ඔවුන් COVID -19 නිරෝධායන රෙගුලාසි වලට අනුකූලව පෞද්ගලිකව තම නිවෙස් කරා ප්‍රවාහනය සිදු කර ගත යුතුය.

VIII. තම නිවෙස්වලට පැමිණි වහාම දුරකථන/ ඊ මේල් මාර්ගයෙන් තම ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා (MoH) දැනුවත් කළ යුතු අතර තමන් සතුව පවතින හෝටලයෙන්/නිරෝධායන මධ්‍යස්ථානයෙන් නිකුත් කරන ලද මුදාහැරීමේ සහතිකය ද ඉදිරිපත් කළ යුතුය.

IX. තම ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා දැනුවත් කළ පසු COVID -19 ප්‍රතිශක්තීකරණ සහතිකය සහ PCR සෘණ වාර්තාව ඔවුන් සතු බැවින් තව දුරටත් ඔවුන් නිරෝධායනය විය යුතු නොවේ.

X. ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා විසින් ඔවුන්ගේ තොරතුරු ප්‍රදේශ භාර වසංගත ඒකකය දැනුවත් කරනු ලැබේ.

XI. අනතුරුව දෙවන PCR පරීක්ෂණය ශ්‍රී ලංකාවට පැමිණ 07 වන දිනයෙහි නැවතත් රජයේ පරීක්ෂණාගාරයකින්/ සෞඛ්‍ය අමාත්‍යාංශය අනුමත පෞද්ගලික පරීක්ෂණාගාරයකින් සිදු කළ යුතුය.

XII. එහිදී COVID -19 වැළදී ඇති බව/රෝග ලක්ෂණ මතුවුවහොත්, තම ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා දැනුවත් කළ යුතු අතර සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ලබාදෙන උපදෙස් පරිදි ප්‍රතිකාර ලබාගත යුතුය.

**2. විදේශයකදී COVID -19 වලට අදාල ප්‍රතිශක්තිකරණ එන්නත් නොලබා/නියමිත මාත්‍රාවන් නොලබා/ මාත්‍රාවන් ලබා සති 02 කට පෙර ශ්‍රී ලංකාවට පැමිණෙන්නන්,**

**2.1 හෝටල්වල නිරෝධායන වන්නන් (තනිව/පවුලේ සාමාජිකයින්ද සමග)**

I. ශ්‍රී ලංකාවට පැමිණ පැය 24 ඇතුලත (පළමු දිනය තුළ ) PCR පරීක්ෂණයක් සහ ශ්‍රී ලංකාවට පැමිණ 07 වන දිනයෙහි PCR පරීක්ෂණයක් රජයේ පරීක්ෂණාගාරයකින්/ සෞඛ්‍ය අමාත්‍යාංශය අනුමත පෞද්ගලික පරීක්ෂණාගාරයකින් සිදු කළ යුතුය.

II. PCR සෘණ ප්‍රතිඵල සහිත තැනැත්තන් 07 වන දිනයෙන් පසුව හෝටලයෙන් තම නිවෙස් වෙත යාමට නිදහස් කරනු ලැබේ.

III. ඔවුන් COVID -19 නිරෝධායන රෙගුලාසි වලට අනුකූලව පෞද්ගලිකව තම නිවෙස් කරා ප්‍රවාහනය සිදු කර ගත යුතුය.

IV. ඔවුන් ගමන් කරන රථයෙහි රියදුරන් නිසි පරිදි සෞඛ්‍යාරක්ෂිත ඇඳුම් වලින් සැරසී සිටිය යුතු අතර නිරෝධායන රෙගුලාසි වලට අනුකූලව මගීන් ප්‍රවාහනය කළ යුතුය.

V. තම නිවෙස්වලට පැමිණි වහාම දුරකථන/ ඊ මේල් මාර්ගයෙන් තම ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා දැනුවත් කළ යුතු අතර තමන් සතුව පවතින PCR සාම්පල් ලබාගත් දිනය සහ පළමු සහ හත්වන දින ලබාගත් PCR ප්‍රතිඵලය ද ඇතුලත් හෝටල් නිරෝධායන මධ්‍යස්ථාන බලධාරින් විසින් නිකුත් කරන ලද මුදාහැරීමේ සහතිකය ද ඉදිරිපත් කළ යුතුය.

VI. තම ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා දැනුවත් කළ පසු ඔවුන් තව දුරටත් ඉතිරි දවස් 07 නිවසේදී අනිවාර්යයෙන් නිරෝධායනය විය යුතුය.

VII. එහිදී COVID -19 වැළදී ඇති බව/රෝග ලක්ෂණ මතුවුවහොත්, තම ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා දැනුවත් කළ යුතු අතර සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ලබාදෙන උපදෙස් පරිදි ප්‍රතිකාර ලබාගත යුතුය.

**2.2 <u>මධ්‍යස්ථානවල නිරෝධායන වන්නන්</u>**

I. ශ්‍රී ලංකාවට පැමිණ පැය 24 ඇතුලත (පළමු දිනය තුල) PCR පරීක්ෂණයක් සහ ශ්‍රී ලංකාවට පැමිණ 10 වන දිනයෙහි PCR පරීක්ෂණයක් රජයේ පරීක්ෂණාගාරයකින්/ සෞඛ්‍ය අමාත්‍යාංශය අනුමත පෞද්ගලික පරීක්ෂණාගාරයකින් සිදු කළ යුතුය.

II. PCR ප්‍රතිඵල දෙකම සෘණාත්මක නම්, 10 වන දිනයෙන් පසුව නිරෝධායන මධ්‍යස්ථානවලින් තම නිවෙස් වෙත යාමට ඔවුන් නිදහස් කරනු ලැබේ.

III. ඔවුන් COVID -19 නිරෝධායන රෙගුලාසි වලට අනුකූලව පෞද්ගලිකව තම නිවෙස් කරා ප්‍රවාහනය සිදු කර ගත යුතුය.

IV. ඔවුන් ගමන් කරන වාහනයේ රියදුරන් නිසි පරිදි සෞඛ්‍යාරක්ෂිත ඇඳුම් වලින් සැරසී සිටිය යුතු අතර නිරෝධායන රෙගුලාසි වලට අනුකූලව මඟීන් ප්‍රවාහනය කළ යුතුය.

V. තම නිවෙස්වලට පැමිණි වහාම දුරකථන/ ඊ මේල් මාර්ගයෙන් තම ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා දැනුවත් කළ යුතු අතර තමන් සතුව පවතින PCR සාම්පල් ලබාගත් දිනය සහ පළමු සහ දහවන දින ලබාගත් PCR ප්‍රතිඵලය ද ඇතුලත් නිරෝධායන මධ්‍යස්ථාන බලධාරින් විසින් නිකුත් කරන ලද මුදාහැරීමේ සහතිකය ද ඉදිරිපත් කළ යුතුය.

VI. තම ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා දැනුවත් කළ පසු ඔවුන් තව දුරටත් ඉතිරි දවස් 04 නිවසේදී අනිවාර්යයෙන් නිරෝධායනය විය යුතුය.

VII. එහිදී COVID -19 වැළදී ඇති බව/රෝග ලක්ෂණ මතුවුවහොත්, තම ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා දැනුවත් කළ යුතු අතර සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ලබාදෙන උපදෙස් පරිදි ප්‍රතිකාර ලබාගත යුතුය.

**ශ්‍රී ලංකා තානාපති කාර්යාලය**
**ටෙල් අවිව්, ඊශ්‍රායලය.**

**18.03.2021**